# අපේ ඉස්කෝලේ අමුතු පුස්තකාලය




S.M.M.M. කල්හාන් සමරසිංහ

# අපේ ඉස්කෝලේ අමුතු පුස්තකාලය

S.M.M.M. කල්හාන් සමරසිංහ

# අපේ ඉස්කෝලේ අමුතු පුස්තකාලය

S.M.M.M. කල්හාන් සමරසිංහ
කතෘ

පළමු දිගහැරීම

පළමු දිගහැරීම

# පිදුම

ඇලපිලි ඉස්පිලි දමා මට වචන
ලියන්නට හුරු කළ, ගලගෙදර
ප්‍රාථමික විදුහලේ ආදරණීය
මගේ නිලූෂි සෙනෙවිරත්න
ගුරු මෑණියන්ටත්
ලස්සනට ලියන්න මට සිතුවිල්ලක්
දුන් ගුරු විදුහල්පති
හේනේගම ගුරු පියාණන්ටත්
පොතට වටිනාකමක්
දුන් සෙනෙවිරත්න ගුරු
පියාණන්ටත්
කෘතඥතාවය පුද කරමි.

# පෙරවදන



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10


# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.


ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමී.


ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10


කන්ද උඩරට සෙන්කඩගල
පුරවරයේ
විශේෂ භූ විෂමතාවයක්
තියෙන ගලගෙදර කපොල්ල
පසු කර හතරලියද්ද පාරේ
තමයි මගේ ඉස්කෝලේ තියෙන්නේ.




ලස්සන පරිසරයක පිහිටි
මගේ පාසලේ විදුහල්පතිතුමා
ඉස්කෝලෙට ලොකු ම
ලොකු නැවක් ගෙනාවා.
ඔව්...... ඇත්තට ම ඒක
ගොඩක් ලොකු ඇත්තම නැවක්




අපේ ලංකාවේ නාවික හමුදාවේ
මාමලා තමයි
අපේ විදුහල්පතිතුමාගේ
ඉල්ලීම නිසා එය අපට
ලබා දීලා තියෙන්නේ.
ඉතින් යාළුවේ ඒ ලොකුම ලොකු නැව
තියන්න, අපේ ඉස්කෝලේ
ක්‍රීඩා පිටිය කෙළෙවරේ
ලොකුම ලොකු වැවකුත් හැදුවා.



ඒ වැව හැදුවේ සිමෙන්තිවලින්.
ඊට පස්සේ අපේ ඉස්කෝලේ
ආදි ශිෂ්‍ය නැන්දලා මාමලා එකතු
වෙලා හදපු වැවයි
ගෙන ආපු නැවයි
තීන්ත වලින් පාට කළා.




ඉතිං යාළුවේ, ඉස්කෝලේ
ගේට්ටුවෙන් ඇතුළු වෙනකොට
අර ලස්සන නැව
මුළු ඉස්කෝලේටම
ආලෝකයක් වගේ ඈතින් බැබළුණා.
මේ නැව බලන්න
හැමෝම වගේ ඉස්කෝලෙට
එන්න පටන් ගත්තා.



දවසක් අපේ ඉස්කෝලේ
ලොකු ම ලොකු උත්සවයක් කියලා අපට
ආරංචි වුණා...........
ඒ අතරේ,

# "පාවෙන පුස්තකාලය"

එහෙම කියලා වැව් බැම්මේ ලොකුම
ලොකු අකුරෙන් ලීවා.




මේ වෙනකොට ලස්සන ම ලස්සන පරිසරයක් වටපිටාවක් එක්ක
නැව ලස්සනට පෙණුනා.





මෙන්න ! ලස්සන දවසක
උත්සවයක් අපේ ඉස්කෝලේ




ඒ නැව ඇතුලේ ලස්සනට හදලා
කතන්දර පොත් ගොඩක් තියලා
පුංචි අපිව පුදුම කරන්න
නැව ඇතුලට අපේ මැඩම්ලා
අපිව එක්කරගෙන
ගියා.




හරිම පුදුම හිතුණා.
අපිට කියවන්න ආසම
හිතෙන විදිහට
විදුහල්පතිතුමා ඇතුළු හැමෝම
මහන්සි වෙලා
අපට පුස්තකාලයක් හදලා තෑගි කළා.



පුංචි අපට හරිම සතුටුයි.
ඉස්කෝලේ ගැන හරිම ආඩම්බරයි.
අපට ඒ අභිමානය ලබාදුන්
විදුහල්පතිතුමා ඇතුළු අනෙකුත්
සියලුම ගුරුවරුන් වගේම
අපගේ දෙමාපියන්ට ද
ගොඩක් ස්තූතියි. !



පුංචි ඔයාලත් ඉතිං අපේ ඉස්කෝලේ
අමුතු පුස්තකාලය බලන්න එන්න.
වතුර පිරිලා තියෙන නිල් පාටට
පෙනෙන වැවේ තමයි
අපේ පාවෙන පුස්තකාලය
තියෙන්නේ..........
අපේ පාසල ඇතුළේ
අපේ ඒ අමුතු පුස්තකාලය
මුළු ලෝකයටම එකයි.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978-624-211-407-1